# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2421/03 - 2025 ජනවාරි මස 27 වැනි සඳුදා - 2025.01.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත**

5 වැනි වගන්තිය යටතේ නියමය

1. 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 5 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය අනුර කුමාර දිසානායක වන මම, "රාමසාන් උපවාස සමයේ නොමිලයේ බෙදාහැරීම සඳහා ගෙන්වනු ලබන රටඉඳි සඳහා බදු සහන ලබාගැනීම" යන මැයෙන් වූ අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 24/2293/822/004 සහ 2024 දෙසැම්බර් මස 30 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි, විදේශ රාජ්‍යයන්, ව්‍යාපාරික ආයතන ඇතුළු සංවිධාන, ස්වේච්ඡා සංවිධාන හා හිතෛෂීන් විසින් පරිත්‍යාග හෝ ත්‍යාග වශයෙන් විදේශ විනිමය වැය නොවන පදනමින් සහ වාණිජ පරමාර්ථ සඳහා භාවිතා නොකළ යුතු බවට ලබාදෙන රටඉඳි ආනයනයේදී, 2024 දෙසැම්බර් මස 31 දිනැති අංක 2417/20 දරන *ගැසට්* නිවේදනය මගින් දක්වා ඇති නියමයේ, සංයෝජිත වර්ගීකරණ සංකේත අංක 0804.10.10 සහ 0804.10.20 යටතේ වන රටඉඳි ආනයනය සඳහා අදාළ වන කිලෝ ග්‍රෑමයකට රු. 200 ක් වන විශේෂ වෙළඳ භාණ්ඩ බද්දෙන් කිලෝ ග්‍රෑමයකට රු. 1 ක් අයකරගෙන ඉතිරි වටිනාකම, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශයට යටත්ව අත්හරිනු ලැබිය යුතු බවට මෙයින් නියම කරනු ලැබේ.

2. මෙම නියමය, 2025 ජනවාරි මස 28 වැනි දින සිට 2025 මාර්තු මස 31 දින දක්වා වූ කාල සීමාවක් සඳහා 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තියේ (3) වන උප වගන්තියේ විධිවිධානවලට යටත්ව, වලංගුව පැවතිය යුතු ය.

**අනුර කුමාර දිසානායක,**
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය.

2025 ක් වූ ජනවාරි මස 27 වැනි දින,
කොළඹ 01,
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ දී ය.

EOG 01-0280

1A - PG 7007 - 429 (2025/01) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*සැ.යු.- මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*